# විසිපස් වසරක්!

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය ගැන පසු විපරමක්

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

2022 දෙසැම්බර්

# පටුන


1. හැඳින්වීම 5

2. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය 7

3. දේශීය යාන්ත්‍රණය 9

    3.1 ශ්‍රේෂ්ඨාධිකරණය 9

    3.2 පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) 9

    3.3 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 9

4. ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය (GANHRI) 15

5. මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි 17

    5.1 වර්ෂ 2019 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවවෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන් 17

    5.2 වර්ෂ 2020 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන් 19

    5.3 වර්ෂ 2019 දී විමර්ශනයන් අවසන් කළ පැමිණිලි 22

    5.4 වර්ෂ 2020 දී විමර්ශනයන් අවසන් කළ පැමිණිලි 23

6. වර්ෂ 2019 -2021 වර්ෂයන්හි දී දිස්ත්‍රික් මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන මගින් මානව හිමිකම් කොමිසම වෙත යොමු කළ පැමිණිලි අතුරින් ප්‍රතිචාර ලැබී තිබෙන ඒවායේ වත්මන් තත්වය පිළිබඳ විශ්ලේෂණය 25

7. නිර්දේශයන් සහ සැලකිල්ලට ගතයුතු පොදු කරුණු 31

# 01. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම, වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවට සැලකිය යුතු කාර්යභාරයක් පැවරී තිබේ. 1996 අංක 21 දරණ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභා පණත හරහා ස්ථාපිත මානව හිමිකම් කොමිෂන් සභාව 1997 වර්ෂයේ ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වී මේ වන විට වසර විසිපහක් 25ක් සම්පූර්ණ කර තිබේ.

කොමිසම සඳහා කොමසාරිස්වරු පත්වීම් ක්‍රියාපටිපාටිය, කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය ජාත්‍යන්තර ප්‍රමිතීන් මත සිදු නොවීම මත අවස්ථා කිහිපයක දී මානව හිමිකම් කොමිෂන් සභාව ඒ ශ්‍රේණියේ සිට බී ශ්‍රේණිය දක්වා පහත දැමීම, කොමිසම වෙත ලැබෙන මහජන පැමිණි විමර්ශනය සිදු කර නිර්දේශ ලබා දීමට ගත කරනු ලබන කාලය, එවැනි විශාල කාලයක් මිඩංගු කර ලබාදෙන නිර්දේශ සමහර රාජ්‍ය ආයතන හෝ නිලධාරීන් විසින් ක්‍රියාත්මක නොකිරීම, අයිතිවාසිකම් කඩ වූ වින්දිතයින් මේ වෙනුවෙන් මිඩංගු කරන කාලය හා මුදලට සාපේක්ෂව කොමිස ලබාදෙන නිර්දේශ ප්‍රමාණවත් නොවීම හා කොමිසම පිළිබඳව තිබූ මහජන විස්වාසය ක්‍රමයෙන් හීනවී යාම මේ මොහොතේ කොමිස කෙරෙහි ඇති විවේචනයන් ලෙස හැඳින් විය හැක.

නමුත්, මේ අතර පැමිණිල්ලක් ඇතිව හෝ නොමැතිව රට තුළ නිර්මාණය වූ මානව හිමිකම් උල්ලංඝණයවීම් සම්බන්ධව වහා මැදිහත් වී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, ඊට අදාල ප්‍රධාන පාර්ශ්වකරුවන් ගෙන්වා විමර්ශණ පැවැත්වීම හා අදාල නිර්දේශ නිකුත් කිරීම, වදහිංසාව හා නීති විරෝධී ඝාතණ සම්බන්ව ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ ඒකකයක් ස්ථාපිත කිරීම, පොලිස් ස්ථාන පරීක්ෂාව විධිමත් කිරීම, ගොඩගැසි ඇති මහජන පැමිණිලි විමර්ශනයන් වේගවත් කිරීම, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නිර්දේශ, නිවේදන හා මාර්ගෝපදේශ නිකුත් කිරීම වැනි ක්‍රියා මාර්ග හේතුවෙන් ඉහත විවේචන යම් පමණක අස්වැසීමට හේතුවක් වී තිබේ.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම, ශක්තිමත් හා කාර්යක්ෂම ආයතනයක් බවට පත්කිරීමත්, සැම විටම එහි කොමසාරිස්වරු ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ පත්වීම්, මාරු කිරීම් හා උසස්වීම් දේශපාලන මැදිහත්වීම්වලින් තොරව ස්වාධීන ක්‍රියා පරිපාටියක් හරහා සිදු කිරීමටත්, ඒ පිළිබඳව මහජන සංවාදය තවදුරටත් පුළුල් කර ගැනීමත්, ඒ හරහා අයිතිවාසිකම් පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරන පුරවැසියන්ගේ සහභාගීත්වය තව දුරටත් වර්ධනය කර ගැනීමත් අරමුණු කරමින් මෙම ප්‍රකාශනය ඔබ අතට පත්කිරීමට අප තීරණය කළෙමු.

# 02. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය

වර්ෂ 1948 දෙසැම්බර් මස 10 වන දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එළිදැක්වීමෙන් පසුව එය පදනම් කරගනිමින් විවිධ වූ ජාත්‍යන්තර ගිවිසුම් සහ කලාපීය ගිවිසුම් ඇති කරගනු ලැබූ අතර, එය ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමට ඉවහල් විය.

පසුව, රාජ්‍යයන් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් ඔවුන්ගේ නීතීන්ට ඇතුළත් කර දේශීය මානව හිමිකම් යාන්ත්‍රණයන් ස්ථාපිත කරන ලදී.

මානව හිමිකම් ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණ පහත පරිදි වේ.

- අන්තර්ජාතික යාන්ත්‍රණ
- කලාපීය යාන්ත්‍රණ
- දේශීය යාන්ත්‍රණ

මෙම විශ්ලේෂණයේ දී අප විසින් අවධානය යොමු කරනු ලබන්නේ මානව හිමිකම් හා සම්බන්ධ දේශීය යාන්ත්‍රණයක් වන මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳව ය.

# 03. දේශීය යාන්ත්‍රණ

දේශීය වශයෙන් මූලික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා සහ එම අයිතිවාසිකම් උල්ලංඝනයවීම්වල දී ඒවා ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන ආයතන පහත පරිදි වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්)
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## 3.1 ශ්‍රේෂ්ඨාධිකරණය

- ඉහළම සහ අවසානාත්මක අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය වන අතර,ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව එහි බලතල ක්‍රියාත්මක කිරීමට බලය ඇත.
- විධායක හෝ පරිපාලන ක්‍රියාවක් හේතුවෙන් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනයවීමක් හෝ උල්ලංඝනයවීමට අත්‍යාසන්න අවස්ථාවක දී යම් පුද්ගලයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට හිමිකම් ඇති බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා ඇත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවෙන් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීම හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාගකොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති බවට දක්වා ඇත.

## 3.2 පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්)

- රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ වෙනත් සමාන ආයතනයක නිලධරයකු විසින් ගනුලබන පරිපාලන තීරණ හේතුවෙන් යම් තැනැත්තෙකුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් හෝ වෙනත් අයුක්තියක් සිදුවන අවස්ථාවලදී එය මගහරවා ගැනීම සඳහා වන සහන ලබාගත හැකි ප්‍රධාන ආයතනයක් ලෙසට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් හෙවත් ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය සැළකිය හැකිය.

## 3.3 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වර්ෂ 1996 අගෝස්තු මාසයේ ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තු පනතක් යටතේ නිර්මාණය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.
- ඊට අදාළ පනත වන්නේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතයි.
- කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය වර්ෂ 1997 ජුලි මාසයේදී ආරම්භ විය.

**මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ අරමුණ කුමක් ද?**

- පැරිස් මූලධර්ම මත පිහිටා ජාතික සහ ප්‍රාදේශීය මට්ටම්වල සිට මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමයි. පැරිස් මූලධර්ම යනු දේශීය මානව හිමිකම් යාන්ත්‍රණ විධිමත් කරන්නා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් ය.

**මානව හිමිකම් කොමිෂන් සභා පනතට අනුව මානව හිමිකම් යන්න නිර්වචනය කරන්නේ කෙසේ ද?**

- ආර්ථික, සමාජ සහ සංස්කෘතික වශයෙන් සහ සිවිල් සහ දේශපාලනික වශයෙන් ජාත්‍යන්තරව ප්‍රකාශයට පත් සහ පිළිගත් සම්මුතීන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතට අනුව මානව හිමිකම් ලෙස නිර්වචනය කෙරෙයි.

**කොමිෂන් සභාවෙහි මූලික කාර්යයන් මොනවා ද?**

- මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන් හෝ උල්ලංඝනයට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳව විභාග කිරීම, විමර්ශනය කිරීම සහ පනතේ විධිවිධානවලට අනුකූලව සමථයකට පත් කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම.
- මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක සහ පරිපාලනමය පිළිවෙත් සහ කාර්යපටිපාටීන් පිළිබඳව සුපරීක්ෂාවෙන් සිටීම.
- මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමට අනුකූලව නීති සම්පාදනය කිරීමටත්, පරිපාලන මගපෙන්වීම් කිරීමටත් ආණ්ඩුවට උපදෙස් සහ සහයෝගය දීම.
- ජාතික නීති පද්ධතිය සහ පාලන ක්‍රමය ජාත්‍යන්තරව පිළිගත් මානව අයිතිවාසිකම්වලට අවනත වෙමින් ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- මානව හිමිකම් ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් සහ අනෙකුත් ජාත්‍යන්තර මෙවලම් උපයෝගී කරගැනීමට ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රට තුළ මානව අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**කොමිෂන් සභාවෙහි බලතල මොනවා ද?**

- මූලික අයිතිවාසිකම් පිළිබඳ යම් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනයට අත්‍යාසන්න වීම පිළිබඳව විමර්ශනය කිරීම.
- කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පළාත්සභා මට්ටමේ උපකමිටු පත් කිරීම.
- යම් අධිකරණයක් ඉදිරියේ විනිශ්චයට භාජනයව පවතින මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නවීමට අදාළව වූ යම් නඩු කටයුතුවලට එම අධිකරණයේ අවසරය ඇතිව මැදිහත් වීම.
- අධිකරණ ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් රඳවාගෙන සිටින තැනැත්තන්ගේ සුභසිද්ධිය උදෙසා ඔවුන් රඳවාගෙන සිටින ස්ථාන නිරතුරුව පරීක්ෂා කිරීම, සුපරීක්ෂණය කිරීම සහ ඔවුන් රඳවාගෙන සිටීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගත යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි පියවර ගැනීම.
- මානව අයිතිවාසිකම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීමෙන් මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම සහ එම පර්යේෂණයන්වල ප්‍රතිඵල ප්‍රචාරණය කිරීම සහ බෙදා දීම.

- කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කිරීමේ දී පැමිණිලිකරු විසින් සාධාරණව දරණ ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාවේ පරම අභිමතය පරිදි ප්‍රදානය කිරීම.
- කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලුදේ කිරීම.

**පුද්ගලයන්ට කුමන වර්ගයේ පැමිණිලි කොමිසම වෙත ඉදිරිපත් කළ හැකි වන්නේ ද?**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 03 වන පරිච්ඡේදය මගින් පිළිගත් මූලික අයිතිවාසිකම් කඩවීම් සහ කඩවීමට අත්‍යාසන්න අවස්ථාවල දී පැමිණිලි ඉදිරිපත් කළ හැකියි.

**කිසිදු පැමිණිලි කිරීමකින් තොරව කරුණු විමර්ශනය කිරීමේ හැකියාව කොමිසමට තිබෙනවා ද?**

- ඔව්. මූලික අයිතිවාසිකම් උල්ලංඝනයකදී, කිසිදු පැමිණිලි කිරීමකින් තොරව කරුණු විමර්ශනය කිරීමට සහ විමසීමට කොමිසමට පුළුවන.

  මෑත උදාහරණ:

  - මාතර, මිදෙල්ලවල වල ප්‍රදේශයේ දී පොලිස් වෙඩි පහරින් පාසල් ශිෂ්‍යයෙකු තුවාල ලැබීමේ සිදුවීම.
  - රඹුක්කන ප්‍රදේශයේ උද්ඝෝෂනයක් අතරතුර දී පොලිස් වෙඩි පහරින් පුද්ගලයෙකු මිය යාම පිළිබඳ සිදුවීම.
  - මහර බන්ධනාගාරය තුළ දී රැඳවියන් පිරිසක් මියයාම හා සම්බන්ධ සිදුවීම.
  - රත්ගම ප්‍රදේශයේ දී ව්‍යාපාරිකයින් දෙදෙනෙකු පැහැරගැනීම සහ ඔවුන්ව නීතිවිරෝධීව ඝාතනය කිරීම පිළිබඳ සිදුවීම.
  - බුර්කාවන් ඇඳ සිටි ගර්භණී මවුවරුන්ට අටළුගම ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සායනට ඇතුල්වීමට ඉඩ නොදීම සම්බන්ධ සිදුවීම.

**ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි සම්බන්ධව විමර්ශනය කොට වාර්තා කරන ලෙසට කොමිෂන් සභාවට දැන්විය හැකි ද?**

- ඔව්. සමහර අවස්ථාවල දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැමිණිලි සම්බන්ධව විමර්ශනය කොට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කරන ලෙස කොමිෂන් සභාවට දන්වයි.

**අයිතිවාසිකම් උල්ලංඝනය වී දීර්ඝ කාලයක් ගතවීමෙන් පසුව කොමිෂන් සභාව වෙතට පැමිණිලි කළ හැකි ද?**

- ඔව්. සාධාරණ හේතු මත මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී දීර්ඝ කාලයක් ගත වූ පසු ඉදිරිපත් කරන පැමිණිලි පිළිබඳව සොයා බැලීමට හැකියාවක් ඇත.

**යම් තැනැත්තෙකු සිරභාරයට ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද අවස්ථාවකදී කොමිෂන් සභාවට එයට මැදිහත් විය හැකි ද?**

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හෝ මහජන ආරක්ෂක ආඥා පනත යටතේ සාදන ලද නියෝගයක් යටතේ යම් තැනැත්තෙකු සිරභාරයට ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද අවස්ථාවක දී ඒ පිළිබඳව ද, එම තැනැත්තන් අත්අඩංගුවේ හෝ රඳවා ගෙන ඇති ස්ථානය පිළිබඳව ද,

එලෙස සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීමේ ආඥාව කරනු ලැබූ තැනැත්තා විසින් සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම කරනු ලැබූ වේලාවේ සිට පැය 48ක් ඇතුළත කොමිෂන් සභාවට වහාම දැනුම් දිය යුතුය.

- තවද, එලෙස අත් අඩංගුවට ගන්නා ලද තැනැත්තෙකු මුදා හරිනු ලැබීම හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කරනු ලැබූ අවස්ථාවක දී ද ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.
- මෙය පැහැර හරින යම් අයෙකු මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු වූ විට සිරදඬුවම් හෝ දඩයකට යටත් කළ හැකිය.
- කොමිෂන් සභාව විසින් රැඳවුම් ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට හෝ වෙනත් යම් ස්ථානයකට ඇතුල් වී එහි රඳවා සිටින තැනැත්තන්ගේ රඳවා ගෙන සිටීමේ කොන්දේසි දැන ගැනීම පිණිස අවශ්‍ය වන පරීක්ෂා කිරීම් සිදු කළ හැකිය.

**මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳව විමර්ශනයක දී අනාවරණය වීම සහ නොවීම මත වූ අවස්ථාවක කොමිසමේ කාර්යය පටිපාටිය කුමක් ද?**

- මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න වීම පිළිබඳව විමර්ශනයකින් පසුව මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න වීම පිළිබඳව,
  - අනාවරණය නොවන අවස්ථාවකදී එම කරුණු වාර්තාගත කර දින තිහක් (30) ඇතුලත පැමිණිලිකරු වෙත දැනුම්දිය යුතු වේ.
  - අනාවරණය වන අවස්ථාවකදී උචිත පරිදි එම කාරණය සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම සඳහා යොමු කළ හැකිය.
- නමුත් එම කාරණය,
  - සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම සඳහා යොමු කිරීම උචිත නොවන බව පෙනී යන අවස්ථාවකදී;
  - එම කාරණය සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම උචිත බව කොමිෂන් සභාවට පෙනී යන නමුත් පාර්ශ්වකරුවන් සියල්ලම හෝ පාර්ශවකරුවන් අතුරින් යම් පාර්ශ්වකරුවෙකු විසින් සමගි කිරීමට හෝ සමථයකට පත් කිරීමට විරුද්ධ වන අවස්ථාවකදී;
  - සමගි කිරීමට හෝ සමථයකට පත් කිරීමට ගත් උත්සහාය අසාර්ථක වූ අවස්ථාවකදී;
    - එම මූලික අයිතිවාසිකම උල්ලංඝනය කරන තැනැත්තාට හෝ තැනැත්තන්ට විරුද්ධව නඩු පවරන ලෙසට හෝ වෙනත් නඩු කටයුතු පවරන ලෙසට උචිත බලධරයන්ට නිර්දේශ කරනු ලැබිය හැකිය.
    - එම උල්ලංඝනය කිරීම හෝ එම උල්ලංඝනය කිරීම දිගටම පැවතීම වැළැක්වීමේ හෝ ඊට ප්‍රතිකර්ම යෙදීමේ අදහසින් උචිත බලධරයා වෙත හෝ අදාළ තැනැත්තා හෝ තැනැත්තන් වෙත කොමිෂන් සභාව සුදුසු යැයි කල්පනා කරන යම් නිර්දේශ කරනු ලැබිය හැකිය.

තවද, කොමිෂන් සභාව විසින්,

මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න වීමට උද්ගත වන;

- අදාළ ක්‍රියාව හෝ නොකර හැරීම නැවත සළකා බලන ලෙසට හෝ නිවැරදි කරන ලෙසට නිර්දේශ කරනු ලැබිය හැකිය.
- අදාළ තීරණය නැවත සළකා බලන ලෙසට හෝ නිවැරදි කරන ලෙසට නිර්දේශ කරනු ලැබිය හැකිය.
- අදාළ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීමට පදනම් වූයේ යම් පිළිවෙතක් මතද එම පිළිවෙත වෙනස් කරන ලෙසට නිර්දේශ කරනු ලැබිය හැකිය.
- අදාළ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීමට හේතු දැක්විය යුතු බවට නිර්දේශ කරනු ලැබිය හැකිය.
- මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න බවට වූ චෝදනාවක දී චෝදිත තැනැත්තාට කරුණු කියා පෑමට අවස්ථාවක් ලබා දිය යුතුය. එසේ නොමැතිව කොමිෂන් සභාව විසින් නිර්දේශයන් කරනු නොලැබිය යුතුය.
- කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශයක පිටපතක් පැමිණිලිකරුට අදාළ ආයතනයේ ප්‍රධානියාට සහ අදාළ ආයතනය භාරව සිටින අමාත්‍යවරයාට යොමු කළ යුතුය.
- නිර්දේශයක් යොමු කරන ලද ආයතනයට හෝ තැනැත්තන්ට එම නිර්දේශයේ සඳහන් කරනු ලබන කාලයක් ඇතුලත එම නිර්දේශ බලාත්මක කිරීම පිණිස අදාළ ආයතනය හෝ තැනැත්තා විසින් ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ගය සම්බන්ධව කොමිෂන් සභාවට වාර්තා කරන ලෙසට නියම කළ හැකිය.
- එම කාලසීමව ඇතුළත කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැර ඇති අවස්ථාවක හෝ එම ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාවේ මතය වූ විට එම කරුණ පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
- ජනාධිපතිවරයා එම වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබීමට සැලැස්විය යුතුය.

**සමගි කිරීමේ හෝ සමථයකට පත් කිරීමේ කාර්යය පටිපාටිය කුමක් ද?**

- පාර්ශ්වකරුවන් අතර සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම පිණිස එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් කිහිපදෙනෙකු කොමිෂන් සභාව විසින් පත් කළ හැකිය.
- එම සමගිකරුවන් හෝ සමථකරුවන් ඉදිරියෙහි පෙනී සිටින ලෙසට පාර්ශ්වකරුවන්ට විධාන කළ හැකිය.
- එම රැස්වීම් රහසිගතව පැවැත්විය හැකිය.
- සමගි කිරීම හෝ සමථ කිරීම සාර්ථක නොවූවිට හෝ පාර්ශ්වකරුවෙකු සමගි කිරීමට හෝ සමථ කිරීමට විරුද්ධ වූ අවස්ථාවක දී ඒ බව සමගිකරුවා හෝ සමථකරුවා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.
- සමගි කිරීම හෝ සමථ කිරීම සාර්ථක වූ විට එළඹුන නිරවුල් කිරීම පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය.
- සමගි කිරීම හෝ සමථ කිරීම සඳහා යොමු කරනු ලැබ නිරවුල් කිරීමකට එළඹ ඇති අවස්ථාවක දී එම නිරවුල් කිරීම බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විය හැකි විධාන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

**විභාග කිරීම හෝ විමර්ශනය කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව සතු බලතල මොනවා ද?**

- ලබා ගැනීමට අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම.
- ප්‍රශ්න කරනු ලැබීමට අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි සියලු තැනැත්තන්ගෙන් සාක්ෂිකරුවන් වශයෙන් ප්‍රශ්න කිරීම.
- දිවුරුම හෝ ප්‍රතිඥා මත යම් සාක්ෂිකරුවෙකුට සාක්ෂි දෙන ලෙසට නියම කිරීම.
- ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින යම් තැනැත්තෙකු සාක්ෂි දීම පිණිස හෝ තම සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම පිණිස කොමිෂන් සභාව වෙත කැඳවීම.
- සාක්ෂිකරුවෙකු ලෙස එම තැනැත්තන්ගෙන් විභාග කිරීම හෝ ඔවුන් සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙසට නියම කිරීම.
- විභාගයකට හෝ විමර්ශනයට මහජනයාට ඇතුළුවීමට ඉඩදීම හෝ එසේ ඉඩ නොදීම.

## 04. ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය Global Alliance of National Human Rights Instituions (GANHRI)

- දේශීය මානව හිමිකම් යාන්ත්‍රණය යටතේ වූ විවිධ රටවල්වල ජාතික මානව හිමිකම් ආයතන වර්ෂ 1946 සිට මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා පිහිටවූ දේශීය ආයතනයන් ලෙස ජාත්‍යන්තර මට්ටමින් පිළිගෙන ඇත.

- දශක තුනක පමණ කාලයක් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ඊට අනුබද්ධ සමහර සංවිධාන මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ආයතනවල ශක්‍යතා පිළිබඳ වාර්තා මාලාවක් සකස් කළහ.

- මෙම වාර්තා කිරීම වර්ෂ 1991 දී පැරිසියේ පැවති මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික ආයතනයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වැඩමුළුවේ දී අවසන් විය. මෙම වැඩමුළුව වර්ෂ 1993 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද 'පැරිස් මූලධර්ම' ලෙස ජනප්‍රිය වූ මාර්ගෝපදේශක මූලධර්ම කෙටුම්පත් කිරීමට හේතු විය.

- අනතුරුව ඔවුන්ගේ දෙවන ජාත්‍යන්තර වැඩමුළුව සඳහා රැස් වූ විට, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වන ආයතනවල ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුව (International Coordinating Committee of Institution for the Promotion and Protection of Human Rights) පිහිටුවා ගන්නා ලද අතර, වර්ෂ 2016 දී එහි නාමය ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය (Global Alliance of National Human Rights Instituions – GANHRI) ලෙස වෙනස් කරන ලදී.

- GANHRI විසින් ජාතික මානව හිමිකම් ආයතනයන්ට පැරිස් මූලධර්මවලට අනුකූලව මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා නායකත්වය සපයනු ලබයි. ලොව පුරා රටවල් 110ක ප්‍රමාණයක් GANHRI හි සාමාජිකත්වය දරණු ලබන අතර, එය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධිත ආයතනයකි.

- මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා කාර්යය ඵලදායී වීමට නම් ජාතික මානව හිමිකම් ආයතනයන් ස්වාධීන විය යුතු අතර, එම ආයතනයන් පිළිබඳව විශ්වසනීයත්වයක් ඇති විය යුතුය. එලෙස විශ්වාසනීයත්වයක් ඇති කිරීමට පැරිස් මූලධර්මයන් මගින් පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය. GANHRI මගින් ජාතික මානව හිමිකම් ආයතනයන් පැරිස් මූලධර්මයන් අනුගමනය කරන්නේද යන්න පිළිබඳව සමාලෝචනයන් සිදුකර එම ආයතනයන් ශ්‍රේණිගත කිරීමකට ලක් කරනු ලබයි.

- මෙරට තුළ මානව හිමිකම් ප්‍රවර්ධන සහ ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික මානව හිමිකම් ආයතනය වන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවයි. ශ්‍රී ලංකාව GANHRI හි සාමාජිකයෙකු වන අතර, ඊ අනුව එම ආයතනය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳව සමාලෝචනයන් සිදුකර ශ්‍රේණිගත කිරීම් සිදු කරනු ලබයි.

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් පහත පරිදි වේ.

| වර්ෂය | ශ්‍රේණිගත කිරීම |
|---|---|
| 2000 | B |
| 2007 ඔක්තෝම්බර් | B |
| 2009 මාර්තු | B |
| 2018 මැයි | A |
| 2021 ඔක්තෝම්බර් | A ශ්‍රේණිගත කිරීම B දක්වා පහත හෙළීමට නිර්දේශ කර ඇත. |

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අන්තර්ජාතික ශ්‍රේණිය පහත හෙළීම**

වර්ෂ 2021 ඔක්තෝම්බර් මාසයේ දී ශ්‍රේණිගත කිරීම් අනුව, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම 'A' ශ්‍රේණියේ සිට 'B' ශ්‍රේණිය දක්වා පහත හෙළීමට GANHRI විසින් වාර්තාවක් මගින් නිර්දේශ නිකුත් කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වයට 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඍණාත්මක ආකාරයට බලපෑම් සිදු කර තිබෙන ආකාරය එම වාර්තාව සවිස්තරව දක්වා තිබේ. එමෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ අනෙක් සාමාජිකයින් පත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ද මෙම වාර්තාව විශාල ඉඩකඩක් ලබා දී ඇත. ජාත්‍යන්තර වශයෙන් තිබෙන මානව හිමිකම් නිර්දේශයන්ට අනුව ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කර ඇති ආකාරය සහ රටේ සිදු වුණු බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සිය කාර්යභාරය ඉටු කිරීමේ දී ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ශ්‍රී ලංකා මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාව ඒවා වෙනුවෙන් ලබා දී ඇති පිළිතුරු ප්‍රමාණවත් නොවනවාය යන්නද මෙහි දී සැලකිල්ලට ගෙන තිබෙන බව පෙනේ.

ශ්‍රී ලංකාවේ පසුගිය වකවානුවේ බන්ධනාගාරවල සිටින සිරකරුවන් ඝාතනය වීම යන නීතිවිරෝධී සහ අයථා සිද්ධි මෙමගින් සැලකිල්ලට පාත්‍ර වී තිබේ. මේ ආකාරයෙන් දිගින් දිගට ම සිදු වුණු බලහත්කාරී ක්‍රියාවන් සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සිය වගකීම් සහ යුතුකම් නිසි පරිදි ඉෂ්ට සිද්ධ කර නැති බව මෙම වාර්තාවේ සඳහන් ය.

# 05. මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලද පැමිණිලි ප්‍රමාණය

වර්ෂ 2019 - 8983

වර්ෂ 2020 - 6417*

* වර්ෂ 2020න් පසුව කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත්කර නැත.

## 5.1 වර්ෂ 2019 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවවෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන්

| පැමිණිලි වර්ගය | ප්‍රාදේශීය කාර්යාල | | | | | | | | | | | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කිලිනොච්චිය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | | | |
| පුද්ගලික නිදහස | 13 | 124 | 16 | 143 | 69 | 15 | 31 | 98 | 109 | 26 | 56 | 700 | 929 | 1629 |
| (a) වධහිංසාව (ශාරීරික සහ මානසික) | 4 | 32 | - | 3 | 13 | 2 | 1 | 24 | 19 | 3 | 7 | 108 | 292 | 400 |
| (b) වෙනස්කොට සැළකීම | 3 | - | 3 | 3 | 8 | 2 | 15 | - | 1 | 8 | 5 | 48 | 1 | 49 |
| (c) අඩත්තේට්ටම් | - | - | 7 | 10 | 23 | 2 | 1 | 17 | - | 4 | 1 | 65 | 202 | 267 |
| (d) ලිංගික අඩත්තේට්ටම් | - | - | - | - | - | - | - | - | - | - | 2 | 2 | 1 | 3 |
| (e) තර්ජනය | - | 19 | - | 3 | 13 | 3 | 3 | 7 | 26 | - | 21 | 95 | - | 95 |
| (f) අත්තනෝමතික සිරභාරයට ගැනීම් / රඳවා තබා ගැනීම් | 6 | 72 | 6 | 121 | 8 | 6 | 10 | 46 | 60 | 9 | 14 | 358 | 417 | 775 |
| (g) අත්අඩංගුවේදී සිදුවන ඝාතනයන් | - | - | - | 2 | 1 | - | - | - | - | - | - | 3 | 5 | 8 |
| (h) නිසි අධිකරණ ක්‍රියාමාර්ග යෙන් බාහිරව සිදුවන ඝාතනයන් | - | - | - | - | 1 | - | - | - | 3 | - | - | 4 | 2 | 6 |
| (i) බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම් | - | - | - | - | 1* | - | - | - | - | - | - | 1 | - | 1 |
| (j) පුද්ගල අතුරුදහන්වීම්** | - | - | - | - | - | - | 1 | 4 | - | - | 5 | 10 | - | 10 |
| (k) සිරකරු අයිතිවාසිකම් | - | 1 | - | 1 | 1 | - | - | - | - | 2 | 1 | 6 | 9 | 15 |
| වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් | 1 | 4 | - | 66 | 6 | 1 | 1006 *** | 15 | 82 | 41 | 2 | 1224 | 16 | 1240 |
| රැකියා | 51 | 71 | 76 | 127 | 25 | 5 | 57 | 133 | 119 | 22 | 34 | 720 | 287 | 1007 |
| අධ්‍යාපනය | 1 | 51 | 18 | 10 | 13 | 7 | 5 | 82 | 76 | 5 | 2 | 270 | 243 | 513 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමාජ සුබසාධනය හා සේවා | 2 | 16 | - | 12 | 17 | 10 | 2 | 11 | 7 | 1 | 4 | 82 | 5 | 87 |
| යටිතල පහසුකම් | 1 | 3 | 1 | 1 | 4 | - | 2 | 14 | 6 | - | 7 | 39 | 7 | 46 |
| ඡන්දහිමියන් හා සම්බන්ධ අයිතිවාසිකම් | - | - | - | 2 | - | - | - | - | 4 | - | - | 6 | 6 | 12 |
| රජයේ ආයතනයගේ නොකර හැරීම් | 12 | 114 | 264 | 199 | 71 | 14 | 73 | 127 | - | 41 | 54 | 969 | 131 | 1100 |
| (a) පොලීසිය | - | 35 | 35 | 81 | 50 | 12 | 48 | 49 | - | 19 | 36 | 365 | 68 | 433 |
| (b) වෙනත් රාජ්‍ය ආයතන | 12 | 79 | 229 | 118 | 21 | 2 | 25 | 78 | - | 22 | 18 | 604 | 63 | 667 |
| ළමා අයිතිවාසිකම් | - | - | - | - | 2 | - | 5 | - | - | 1 | - | 8 | - | 8 |
| ආබාධිත තැනැත්තන් සඳහා වූ අයිතිවාසිකම් | - | 6 | - | - | 3 | 10 | 2 | - | 4 | - | 1 | 26 | 5 | 31 |
| භාෂා අයිතිවාසිකම් | - | - | - | - | 3 | - | - | - | - | - | 1 | 4 | 3 | 7 |
| විදෙස්ගත ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් | - | 1 | - | 8 | - | - | 1 | 1 | 1 | - | 5 | 17 | 7 | 24 |
| LGBT අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | 1 | 1 | 2 | 3 |
| සෞඛ්‍ය අයිතිවාසිකම් | - | 2 | - | - | 1 | - | 1 | - | 1 | 1 | 1 | 7 | 4 | 11 |
| ඉඩම් හා දේපළ අයිතිවාසිකම් | 19 | 53 | 5 | 9 | 10 | 18 | 10 | 38 | 11 | 7 | 39 | 219 | 43 | 262 |
| සංක්‍රමණික / සරණාගත | - | - | - | - | 1 | - | - | - | - | - | 10 | 11 | - | 11 |
| පාරිසරික අයිතිවාසිකම් | - | 4 | - | 4 | 1 | - | 5 | 11 | 1 | 1 | 1 | 28 | 8 | 36 |
| පරිපාලනමය විෂමතා | 1 | - | 42 | - | 9 | 2 | - | 73 | 16 | 17 | 6 | 166 | 30 | 196 |
| කාන්තා අයිතිවාසිකම් | - | - | - | 5 | - | - | 1 | - | - | - | - | 6 | 1 | 7 |
| වෙනත් (විෂය පථයට අයත් නොවන, වෙනත් ආයතන වෙත යොමු කළ) | 31 | 112 | 89 | - | 1 | - | 2 | 73 | 131 | 8 | 8 | 455 | 2298 | 2753 |
| එකතුව | **132** | **561** | **511** | **586** | **236** | **82** | **1203** | **676** | **568** | **171** | **232** | **4958** | **4025** | **8983** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව - වාර්ෂික වාර්තාව 2019.*
*පිටු අංක. 48, 49 සහ 50.*

* බලහත්කාරයෙන් අතුරුදහන් වූ බවට පැමිණිල්ල ලැබුණත් ස්ව කැමැත්තෙන් අතුරුදහන්වීමේ සිදුවීමක් බවට පසුව අනාවරණය විය.

** මුල් අවස්ථාවේ දී පැමිණිලි මෙම කාණ්ඩයට අදාළව භාරගෙන තිබුණ ද, කොමිසමේ විෂය පථයට අදාළ නොවන බවට පසුව අනාවරණය විය.

*** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව රට තුළ උද්ගත වූ තත්ත්වය හේතු විය.

- මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ පුද්ගලික නිදහස සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 18.1%ක් (1629) වේ.
- පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ලැබී ඇත්තේ අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳවය. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 8.6%ක (775) ප්‍රමාණයකි. අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය (417) වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (121) වාර්තා වන්නේ මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

- දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ වධහිංසාව සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 4.4% (462)කි. ඒ සම්බන්ධයෙන්ද වැඩිම පැමිණිලි ප්‍රමාණයක් වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය (292) වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (32) වාර්තා වන්නේ අනුරාධපුරය ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

- අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ රාජ්‍ය ආයතනයන් තුළින් සිදුවන සේවා පැහැර හැරීම්, නොකර හැරීම් සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 12.2%කි (1100).

- දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනය වීම් (1240) පිළිබඳවය. මෙම පැමිණිලි අතුරින් පැමිණිලි 1006ක් ලැබී ඇත්තේ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය හා සම්බන්ධව සිදුවූ තත්ත්වයන් පිළිබඳවය.

- ළමා හා කාන්තා අයිතිවාසිකම්, භාෂා අයිතිවාසිකම් සහ LGBT අයිතිවාසිකම් සම්බන්ධයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව පැමිණිලි ලැබී ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි.

- කෙසේ වුවද, මානව හිමිකම් කොමිෂන් සභාවේ විෂය පථයට නොගැනෙන හා වෙනත් ආයතනවලට යොමුකරන ලද පැමිණිලි සංඛ්‍යාව සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 30.6%ක (2753) ප්‍රමාණයකි. එම පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ප්‍රධාන කාර්යාලය (2298) වෙත ලැබී ඇති අතර, දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මාතර ප්‍රාදේශීය කාර්යාලය (131) වෙතටය.

- ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය (1203) වෙතටය. අඩුම පැමිණිලි සංඛ්‍යාවක් (82) ලැබී ඇත්තේ කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

## 5.2 වර්ෂ 2020 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන්

| පැමිණිලි වර්ගය | ප්‍රාදේශීය කාර්යාල | | | | | | | | | | | | | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කිලිනොච්චිය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | මන්නාරම | පුත්තලම | | | |
| පුද්ගලික නිදහස | 21 | 124 | 18 | 67 | 114 | 40 | 31 | 99 | 142 | 28 | 56 | 16 | 119 | 875 | 994 | 1869 |
| (a) වධහිංසාව (ශාරීරික සහ මානසික) | 9 | 48 | - | - | 47 | 1 | 2 | 15 | 12 | 2 | 9 | 3 | 18 | 166 | 249 | 415 |
| (b) වෙනස්කොට සැළකීම | - | 1 | 4 | 2 | 1 | 1 | 21 | - | - | 1 | 1 | 1 | 3 | 36 | - | 36 |
| (c) අඩත්තේට්ටම් | 2 | - | 9 | 8 | 21 | 1 | - | 21 | - | 7 | 14 | 4 | 15 | 102 | 213 | 315 |
| (d) ලිංගික අඩත්තේට්ටම් | - | - | - | 1 | - | - | - | - | - | - | - | - | - | 1 | 2 | 3 |
| (e) තර්ජනය | - | 7 | - | 2 | 22 | 8 | 1 | 1 | 28 | 3 | 15 | 3 | 45 | 135 | - | 135 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (f) අත්තනෝමතික සිරභාරයට ගැනීම් / රඳවා තබා ගැනීම් | 10 | 63 | 4 | 53 | 22 | 29 | 7 | 58 | 98 | 15 | 17 | 5 | 38 | 419 | 491 | 910 |
| (g) අත්අඩංගුවේදී සිදුවන ඝාතනයන් | - | 3 | 1 | 1 | - | - | - | - | 3 | - | - | - | - | 8 | 21 | 29 |
| (h) නිසි අධිකරණ ක්‍රියාමාර්ග යෙන් බාහිරව සිදුවන ඝාතනයන් | - | - | - | - | 1 | - | - | - | - | - | - | - | - | 1 | 4 | 5 |
| (i) සිරකරු අයිතිවාසිකම් | - | 2 | - | - | - | - | - | 4 | 1 | - | - | - | - | 7 | 14 | 21 |
| වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් | - | 1 | - | 2 | 2 | - | 6 | 1 | - | 1 | 5 | 3 | - | 21 | 11 | 32 |
| රැකියා | 26 | 57 | 38 | 23 | 28 | 1 | 37 | 136 | 51 | 8 | 18 | 8 | 17 | 448 | 269 | 717 |
| අධ්‍යාපනය | - | 13 | 14 | 8 | 16 | 1 | 11 | 43 | 60 | - | 1 | 2 | 4 | 173 | 138 | 311 |
| සමාජ සුබසාධනය හා සේවා | - | 17 | - | 5 | 4 | 2 | 1 | 11 | 3 | - | 2 | 7 | 6 | 58 | 1 | 59 |
| යටිතල පහසුකම් | 1 | 4 | 2 | - | - | - | 2 | 5 | 2 | 1 | 3 | - | - | 20 | 6 | 26 |
| ඡන්දහිමියන් හා සම්බන්ධ අයිතිවාසිකම් | - | - | - | 3 | 2 | - | - | 1 | - | - | 2 | - | 1 | 9 | 2 | 11 |
| රජයේ ආයතනයගේ නොකර හැරීම් | 26 | 116 | 53 | 92 | 74 | 13 | 97 | 137 | 33 | 17 | 39 | 22 | 31 | 750 | 103 | 853 |
| (a) පොලීසිය | 14 | 38 | 35 | 66 | 59 | 11 | 73 | 48 | 28 | 5 | 29 | 12 | 21 | 439 | 63 | 502 |
| (b) වෙනත් රාජ්‍ය ආයතන | 12 | 78 | 18 | 26 | 15 | 2 | 24 | 89 | 5 | 12 | 10 | 10 | 10 | 311 | 40 | 351 |
| ළමා අයිතිවාසිකම් | - | 1 | - | 1 | 4 | - | 7 | - | - | - | - | - | 7 | 20 | - | 20 |
| ආබාධිත තැනැත්තන් සඳහා වූ අයිතිවාසිකම් | - | 7 | - | 1 | 1 | - | 1 | 1 | 1 | - | - | - | - | 12 | 1 | 13 |
| භාෂා අයිතිවාසිකම් | - | - | - | - | 1 | - | - | - | - | - | 1 | - | - | 2 | 2 | 4 |
| විදෙස්ගත ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් | - | 3 | - | - | - | - | 1 | 6 | - | - | 2 | - | - | 12 | 4 | 16 |
| LGBT අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | 1 | - | - | - | - | - | 1 | - | 1 |
| සෞඛ්‍ය අයිතිවාසිකම් | - | 2 | - | 1 | - | 2 | 1 | - | - | - | 2 | - | 6 | 14 | - | 14 |
| ඉඩම් හා දේපළ අයිතිවාසිකම් | 23 | 34 | 14 | 23 | 3 | 8 | 18 | 27 | 5 | 5 | 24 | 24 | 40 | 248 | 30 | 278 |
| සංක්‍රමණික / සරණාගත | - | - | - | - | 1 | - | - | - | - | - | 5 | - | - | 6 | - | 6 |
| පාරිසරික අයිතිවාසිකම් | 1 | 1 | - | 4 | - | - | 2 | 1 | 3 | - | 1 | - | 1 | 14 | 5 | 19 |
| පරිපාලනමය විෂමතා | 2 | - | 28 | 8 | 7 | 1 | - | 44 | 5 | 11 | - | - | 12 | 118 | 50 | 168 |
| කාන්තා අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2 | 2 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් (විෂය පථයට අයත් නොවන, වෙනත් ආයතන වෙත යොමු කළ) | - | - | - | 2 | 2 | - | 3 | - | - | - | - | - | 1 | 8 | - | 8 |
| එකතුව | **100** | **498** | **189** | **267** | **263** | **70** | **227** | **551** | **440** | **79** | **181** | **99** | **245** | **3205** | **3212** | **6417** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව - වාර්ෂික වාර්තාව 2020.*
*පිටු අංක. 42, 43 සහ 44.*

- වර්ෂ 2020 දී මන්නාරම සහ පුත්තලම යන ප්‍රදේශයන්වල නව ප්‍රාදේශීය කාර්යාල දෙකක් පිහිටුවා ඇත.

- මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ පුද්ගලික නිදහස සම්බන්ධයෙනි. එම ප්‍රමාණය (1869) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 29.1%ක් වේ.

- පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ලැබී ඇත්තේ අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳවය. එම ප්‍රමාණය (910) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 14.1%ක ප්‍රමාණයකි. අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (491) වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (98) වාර්තා වන්නේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

- දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ වධහිංසාව සම්බන්ධයෙනි. එම ප්‍රමාණය (415) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 6.4% කි. ඒ සම්බන්ධයෙන්ද වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (249) වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (48) වාර්තා වන්නේ අනුරාධපුරය ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

- අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (853) ලැබී ඇත්තේ රාජ්‍ය ආයතනයන් තුළින් සිදුවන සේවා පැහැර හැරීම්, නොකර හැරීම් සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 13.2%කි .

- භාෂා අයිතිවාසිකම් සහ LGBT අයිතිවාසිකම් සම්බන්ධයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව පැමිණිලි ලැබී ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි.

- තවද, වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳව පැමිණිලි දෙකක්ද ප්‍රධාන කාර්යාලය වෙත ලැබී ඇත.

- කෙසේ වුවද, මානව හිමිකම් කොමිෂන් සභාවේ විෂය පථයට නොගැනෙන හා වෙනත් ආයතන වලට යොමුකරන ලද පැමිණිලි සංඛ්‍යාව (1990) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 31%ක ප්‍රමාණයකි. එම පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (1594) ප්‍රධාන කාර්යාලය වෙත ලැබී ඇති අතර, දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (134) ලැබී ඇත්තේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

- ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (498) ලැබී ඇත්තේ අනුරාධපුරය ප්‍රාදේශීය කාර්යාලය වෙතටය. අඩුම පැමිණිලි සංඛ්‍යාවක් (70) ලැබී ඇත්තේ කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශනයන් අවසන් කළ පැමිණිලි ප්‍රමාණය

වර්ෂ 2019 - 5096

වර්ෂ 2020 - 3657*

* වර්ෂ 2020න් පසුව කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත්කර නැත.

## 5.3 වර්ෂ 2019 දී විමර්ශනයන් අවසන් කළ පැමිණිලි

| ප්‍රතිඵලය අනුව වර්ගීකරණය | අම්පාර | අනුරාධපුරය | මඩකලපුව | බදුල්ල | යාපනය / කිලිනොච්චිය | මහනුවර | කල්මුණේ | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | ප්‍රධාන කාර්යාලය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමථය | 17 | 184 | 48 | 36 | 120 | 44 | 53 | 1 | 5 | 59 | 68 |
| මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොවන/විෂය පථයට අදාළ නොවන | 50 | 207 | 84 | 62 | 76 | 336 | 2 | 64 | 48 | 75 | 368 |
| පැමිණිල්ලේ උනන්දුව අවම වීම | 30 | 76 | 36 | - | 33 | 96 | 31 | 46 | 32 | 33 | 1260 |
| ඉල්ලා අස්කර ගැනීම | - | 18 | 8 | - | 8 | 19 | - | 24 | 8 | 13 | 156 |
| වෙනත් ආයතනවලට යොමුකළ | - | 14 | 3 | - | 13 | 5 | 1 | 31 | - | - | 14 |
| අධිකරණමය කටයුතු පැවතීම | 12 | 22 | 21 | - | 15 | 19 | 1 | 4 | 5 | - | 173 |
| සහන ප්‍රදානය කිරීම | 12 | - | 125 | - | 29 | 64 | 96 | 50 | 57 | 36 | 155 |
| උපදෙස් ලබා දීම | - | - | - | - | - | - | - | - | - | - | 5 |
| නියමිත කාලසීමාව පසුවීම | - | - | - | - | - | 2 | - | - | - | - | 2 |
| නිර්දේශ ලබා දීම | - | 26 | - | - | 19 | 21 | 1 | - | - | - | 79 |
| උප එකතුව | 121 | 547 | 325 | 98 | 313 | 636 | 185 | 220 | 155 | 216 | 2280 |
| එකතුව | 5096 | | | | | | | | | | |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව - වාර්ෂික වාර්තාව 2019.*
*පිටු අංක. 52.*

- විමර්ශනයන් අවසන් වූ පැමිණිලි අතුරින් වැඩිම ප්‍රමාණයක් පැමිණිල්ලේ උනන්දුව අවම වීම හේතුවෙන් අවසන් වූ පැමිණිලි වේ. එම පැමිණිලි ප්‍රමාණය (1673) සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 32.8%කි.
- මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොවන/විෂය පථයට අදාළ නොවන පැමිණිලි 1372ක විමර්ශනයන් අවසන් කර ඇත. එම පැමිණිලි ප්‍රමාණය සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 26.9%කි.
- සමස්ථ පැමිණිලි අතුරින් නිර්දේශ ලබා දුන් පැමිණිලි ප්‍රමාණය 146කි. එම පැමිණිලි ප්‍රමාණය සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 2.8%කි.
- වැඩිම නිර්දේශ ප්‍රමාණයක් (79) ප්‍රදානය කර ඇත්තේ ප්‍රධාන කාර්යාලය විසිනි.

- ප්‍රාදේශීය කාර්යාල අතුරින් අනුරාධපුරය ප්‍රාදේශීය කාර්යාලය විසින් වැඩිම නිර්දේශ ප්‍රමාණයක් (26) ප්‍රදානය කර ඇත.

- මෙම වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය මගින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් අවසන් කර ඇත. එම පැමිණිලි ප්‍රමාණය (2280) සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 44.7%කි.

- ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (636) අවසන් කර ඇත්තේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලයයි.

## 5.4 වර්ෂ 2020 දී විමර්ශනයන් අවසන් කළ පැමිණිලි

| ප්‍රතිඵලය අනුව වර්ගීකරණය | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කිලිනොච්චිය | මහනුවර | කල්මුණේ | මාතර | ත්‍රිකුණාමලය | මන්නාරම | වවුනියාව | පුත්තලම | ප්‍රධාන කාර්යාලය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමථය | 10 | 195 | 22 | 221 | 115 | 49 | 16 | 29 | 2 | 5 | 29 | 18 | - | 45 |
| මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොවන | 11 | 58 | 34 | 27 | 86 | 71 | 211 | 10 | 153 | 56 | 18 | 29 | - | 112 |
| විෂය පථයට අදාළ නොවන | - | - | 15 | - | 19 | 10 | 38 | - | 120 | 8 | 5 | - | 195 | 70 |
| පැමිණිල්ලේ උනන්දුව අවම වීම | 24 | 60 | 25 | 25 | 11 | 10 | 98 | 30 | 75 | 41 | 10 | 7 | - | 231 |
| ඉල්ලා අස්කර ගැනීම | 1 | 7 | - | 3 | 11 | - | 11 | 1 | 18 | 4 | 2 | 4 | - | 62 |
| වෙනත් ආයතනවලට යොමුකළ | - | 21 | 36 | 4 | 9 | 1 | 19 | 6 | 11 | - | - | 2 | - | 2 |
| අධිකරණමය කටයුතු පැවතීම | 24 | 12 | - | 3 | 3 | 4 | 35 | 3 | 6 | - | - | - | - | 60 |
| සහන ප්‍රදානය කිරීම | 7 | - | 9 | 86 | 6 | 5 | 59 | 33 | 44 | 11 | 24 | 28 | - | 52 |
| උපදෙස් ලබා දීම | - | - | - | 1 | - | - | 36 | - | - | - | - | - | - | 1 |
| නියමිත කාලසීමාව පසුවීම | - | - | - | - | 1 | - | 6 | - | 20 | - | - | 1 | - | - |
| නිර්දේශ ලබා දීම | - | - | - | - | - | - | - | - | - | - | | - | 22 | 60 |
| උප එකතුව | 77 | 353 | 141 | 370 | 261 | 150 | 529 | 113 | 449 | 125 | 88 | 89 | 217 | 695 |
| එකතුව | | | | | | | | | | | | | | 3657 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව - වාර්ෂික වාර්තාව 2020*
*පිටු අංක. 46.*

- විමර්ශනයන් අවසන් වූ පැමිණිලි අතුරින් වැඩිම ප්‍රමාණයක් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොවීම හේතුවෙන් අවසන් වූ පැමිණිලි වේ. එම පැමිණිලි ප්‍රමාණය (876) සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 23.9%කි.

- පැමිණිල්ලේ උනන්දුව අවම වීම හේතුවෙන් පැමිණිලි 647ක විමර්ශනයන් අවසන් කර ඇත. එම පැමිණිලි ප්‍රමාණය සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 17.6%කි.

- විෂය පථයට අදාළ නොවන පැමිණිලි 480ක විමර්ශනයන් අවසන් කර ඇත. එම පැමිණිලි ප්‍රමාණය සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 13.1%කි.

- සමස්ථ පැමිණිලි අතුරින් නිර්දේශ ලබා දුන් පැමිණිලි ප්‍රමාණය 82කි. එම පැමිණිලි ප්‍රමාණය සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 2.2%ක

- වැඩිම නිර්දේශ ප්‍රමාණයක් (60) ප්‍රදානය කර ඇත්තේ ප්‍රධාන කාර්යාලය විසිනි.
- ප්‍රාදේශීය කාර්යාල අතුරින් පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය විසින් වැඩිම නිර්දේශ ප්‍රමාණයක් (22) ප්‍රදානය කර ඇත.
- මෙම වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය මගින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (695) අවසන් කර ඇත. එම පැමිණිලි ප්‍රමාණය සමස්ථ පැමිණිලි ප්‍රමාණයෙන් 19%කි.
- ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (529) අවසන් කර ඇත්තේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලයයි.

## 06. වර්ෂ 2019 -2021 වර්ෂයන්හි දී දිස්ත්‍රික් මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන මගින් මානව හිමිකම් කොමිසම වෙත යොමු කළ පැමිණිලි අතුරින් ප්‍රතිචාර ලැබී තිබෙන ඒවායේ වත්මන් තත්වය පිළිබඳ විශ්ලේෂණය

| දිස්ත්‍රික්කය | පැමිණිලිකරුගේ නම | පැමිණිලි වර්ගය | | | | | වග උත්තරකරු කවුද යන වග | පැමිණිල්ල යොමු කළ දිනය | කොමිසමේ ලියාපදිංචි වූ දිනය සහ ලියාපදිංචි අංකය | කොමිසම විමසීම් පැවැත්වූ දිනයන් | කොමිසම පවත්වා ඇති විමසීම් ගණන | කොමිසම නිර්දේශ ලබා දී තිබේද තිබේ නම් ලබා දී ඇති දිනය | කොමිසමට පැමිණිලි කිරීම හේතුකොට ගෙන විත්තියාට කුමක් හෝ විපාකයක් හෝ සහනයක් ලැබී තිබේද |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වධහිංසනය | නීතිවිරෝධී ඝාතන | නීතිවිරෝධී අත් අඩංගුවට ගැනීම් | නීතිවිරෝධී රඳවා ගැනීම් | පරිපාලන විෂමතා | | | | | | | |
| 01) හම්බන්තොට | විජේසේකර ආරච්චිගේ ශාන්ත | x | | x | | x | හුංගම පොලිස් ස්ථානය | 2019/01/04 | 2019/01/04 HRC/43/19 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 02) හම්බන්තොට | මල්කාන්ති වික්‍රමරත්න | x | | | x | | හුංගම පොලිස් ස්ථානය | 2019/02/28 | 2019/03/14 HRC/815/19 කොළඹ කාර්යාලය | 2019/ 07/ 18 | 01 | නැත | නැත |
| 03) ගම්පහ | ටයිටස් කුමාර කරුණාරත්න | x | | | | | කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරියෙකු | 2019/02/13 | 2019/02/14 HRC/567/19 කොළඹ කාර්යාලය | 2019/03/22 2019/04/02 | 02 | නැත | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04) ගම්පහ | කේ. මාලනී සිල්වා | | | x | x | x | ජාඇල පොලිස් ස්ථානය | 2019/02/25 | HRC/685/19 කොළඹ කාර්යාලය | 2019/04/26 2019/07/05 | 02 | පැමිණිලිකාරිය විසින් 2019/06/19 වන දින පැමිණිල්ල ඉල්ලා අස්කර ගෙන තිබේ. | නැත |
| 05) ගම්පහ | නීල් ජගත් ප්‍රනාන්දු | | | x | | x | සීදූව පොලිස් ස්ථානය | 2019/03/19 | 2019/04/30 HRC/966/19 කොළඹ කාර්යාලය | නැත | නැත | 2019/04/30 දින කොමිසම විසින් ලිඛිතව දන්වා ඇත්තේ සිද්ධිය සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කරන ලෙසත් ඒ අනුව මානව හිමිකම් කොමිසම සිද්ධියට තවදුරටත් මැදිහත් වීමක් සිදු නොකරන බවයි. | නැත |
| 06) කුරුණෑගල | මාධවී බුද්ධිකා | x | | | | x | විශේෂඥ ශල්‍ය වෛද්‍ය අශෝක වීජේමාන්න කුරුණෑගල ශික්ෂණ රෝහල | 2019/03/29 | 2019/04/02 HRC/151/19 මහනුවර කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 07) ගම්පහ | ඈන් රණවීර | x | | x | | x | පමුණුගම පොලිස් ස්ථානය | 2019/08/19 | 2019/08/19 HRC/2406/19 කොළඹ කාර්යාලය | 2020/09/02 | 01 | මූලික අයිතිවාසිකම් නඩුවක් පවතින හෙයින් ගොනුව බහා තබා ඇත. | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 08) ගාල්ල | එම්. එල්. ඇජිත් කුමාර | | | x | | | වඳුරඹ පොලිස් ස්ථානය | 2019/12/17 | 2020/01/27 HRC/526/19 මාතර කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 09) කළුතර | බුද්ධික මදුෂාන් | x | | x | | x | පයාගල පොලිස් ස්ථානය | 2020/04/27 | 2020/04/27 HRC/906/20 කොළඹ කාර්යාලය | නැත | නැත | මූලික අයිතිවාසිකම් නඩුවක් පවතින හෙයින් ගොනුව බහා තබා ඇත. | නැත |
| 10) පුත්තලම | දිනෙත් විදුරංග | | | | | x | කුලියාපිටිය පොලිස් ස්ථානය | 2020/06/07 | 2020/06/16 HRC/960/20 පුත්තලම කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 11) ගාල්ල | රුහුණගේ මෙරලින් | | | | | x | තලල්ල ගොවිජන සේවා කාර්යාලය | 2020/09/16 | 2020/09/27 HRC/277/20 මාතර කාර්යාලය | නැත | නැත | 2020/09/27 දින කොමිසම විසින් ලිඛිතව දන්වා ඇත්තේ අදාළ පැමිණිල්ල කොමිසමේ විෂය පථයට අදාළ නොවන බවත් ඒ අනුව ගොනුව වසා දමන බවයි. | නැත |
| 12) කළුතර | සුරන්ජිත් වික්‍රමනායක | x | | x | | x | බදුරලිය පොලිස් ස්ථානය | 2020/10/06 | 2020/11/24 HRC/2374/20 කොළඹ කාර්යාලය | නැත | නැත | මූලික අයිතිවාසිකම් නඩුවක් පවතින හෙයින් ගොනුව බහා තබා ඇත. | නැත |
| 13) කුරුණෑගල | යමුනා කුමාරි | x | | x | | x | ගොකරැල්ල පොලිස් ස්ථානය | 2020/10/26 | 2020/12/22 HRC/2554/20 පුත්තලම කාර්යාලය | 2021/03/12 | 01 | නැත | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 14) මාතර | ධනුෂ්ක මධුරංග | x | | x | | x | හක්මන පොලිස් ස්ථානය | 2021/01/26 | 2021/01/26 HRC/MTR/ R6/21 මාතර කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 15) ගාල්ල | සිසිර කුමාර | x | | x | x | x | යක්කලමුල්ල පොලිස් ස්ථානය | 2021/05/20 | 2021/10/05 HRC/ HO/1552/21 | නැත | නැත | නැත | නැත |
| 16) කොළඹ | ලීලානි දයාරත්න | x | | x | x | x | පාදුක්ක පොලිස් ස්ථානය | 2021/06/29 | 2021/06/29 HRC/ HO/1472/21 කොළඹ කාර්යාලය | 2021/12/21 | 01 | මූලික අයිතිවාසිකම් නඩුවක් පවතින හෙයින් ගොනුව බහා තබා ඇත. | නැත |
| 17) මාතර | එච්.ජී. ධර්මබන්දු | x | | | | x | කොටවිල පොලිස් ස්ථානය | 2021/08/10 | 2021/08/10 HRC/ MTR/ 200/21/N මාතර කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 18) පුත්තලම | රේණුකා නිමාලි | | | | | x | ප්‍රාදේශීය ලේකම් ආනමඩුව | 2021/10/25 | 2022/01/18 HRC/HO/ 2756/21 පුත්තලම කාර්යාලය | 2022/08/30 | 01 | මූලික අයිතිවාසිකම් නඩුවක් පවතින හෙයින් ගොනුව බහා තබා ඇත. | සමථ වී ඇත. |

මෙහිදී හම්බන්තොට ගම්පහ කුරුණෑගල ගාල්ල කළුතර පුත්තලම මාතර සහ කොළඹ යන භූගෝලීය සීමාව අනුව දිස්ත්‍රික්ක 08කින් වාර්ථා වී ඇති සිද්ධීන් අතුරින් තෝරාගත් සිද්ධි කිහිපයක් විශ්ලේෂණයට භාජනය කෙරුණි. එහිදී සිද්ධියට අදාළ පැමිණිල්ල කුමන වර්ගයකට අයත් වේද යන්න මානව හිමිකම් දෘෂ්ඨි කෝනයෙන් ප්‍රධාන කාණ්ඩ 05ක් යටතේ සැලකිල්ලකට භාජනය කරන ලදි. එම කාණ්ඩ 05 වන්නේ

1. වධහිංසනය
2. නීති විරෝධී ඝාතන
3. නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්
4. නීතිවිරෝධී රඳවා ගැනීම්
5. පරිපාලන විෂමතා

මෙහිදී එක් එක් සිද්ධියට අදාළ පැමිණිල්ල ඉහත කාණ්ඩ 05 යටතේ විශ්ලේෂණය කර බැලීමේදී නිරීක්ෂණය වන්නේ ඇතැම් ඒවා ඉහත කාණ්ඩ එකකට වඩා අයත් වන බවයි. ඒ අනුව විශ්ලේෂණයට භාජනය කරන ලද සිද්ධිමය පැමිණිලි වලින් 39% ක ප්‍රතිශතයක් කාණ්ඩ 03ක් යටතට වැටෙන බවත් 11% ක ප්‍රතිශතයක් කාණ්ඩ 04ක් යටතට වැටෙන බව නිරීක්ෂණය වේ. එසේම සියයට 22 ක ප්‍රතිශතයක් කාණ්ඩ 02ක් යටතට වැටෙන අතර එක් කාණ්ඩයක් යටතට පමණක් වැටෙන ප්‍රතිශතය 28% ක් බව නිරීක්ෂණය වේ.

2019 වර්ෂයේ සිට 2021 වර්ෂාවසානය දක්වා ඉහත විශ්ලේෂණයට භාජනය කරන ලද සිද්ධිමය පැමිණිලි වලින් වධහිංසනයන් සම්බන්ධයෙන් 33% ක ප්‍රතිශතයක් නිරූපණය වන අතර 61% ක ප්‍රතිශතයක් නීතිවිරෝධී අත් අඩංගුවට ගැනීම් වලට අදාළව නිරූපණය වේ.

මීට අමතරව ඉහත එක් එක් සිද්ධිමය පැමිණිල්ල මානව හිමිකම් කොමිසම මගින් පවත්වා ඇති විමසීම් ගණන එකී පැමිණිලි සම්බන්ධයෙන් කොමිසම මගින් නිර්දේශ ලබා දී තිබේද යන්න සහ අවම වශයෙන් කොමිසමට පැමිණිලි කිරීම හේතු කොට ගෙන අදාළ වින්දිතයාට කුමන ආකාරයක විසඳුමක් හෝ සහනයක් ලැබී තිබේද යන්න පිළිබඳව විශ්ලේෂණයට භාජනය කරන ලදි.

එහිදී මෙහි විශ්ලේෂණයට භාජනය කරන ලද සිද්ධිමය පැමිණිලි වලින් 61% ක ප්‍රතිශතයක් මේ වන තෙක් කොමිසම මගින් දෙපාර්ශවය කැඳවා හෝ අවම වශයෙන් වින්දිත පාර්ශවය හෝ කැඳවා එකදු විමසීමකටවත් භාජනය කොට නොමැති අතර අවම වශයෙන් එලෙස එක් විමසීමක් හෝ සිදු කොට ඇත්තේ 39% ක ප්‍රතිශතයක් සඳහා පමණි.

එසේම මෙහි විශ්ලේෂණයට භාජනය කරන ලද සිද්ධිමය පැමිණිලි වලින් මේ වන විට කොමිසම නිර්දේශ ලබා දී තිබෙන්නේ 11%ක ප්‍රතිශතයක් සඳහා පමණක් බවද මේ විශ්ලේෂණය තුළින් ගම්‍ය වේ. එසේම මෙහිදී විශ්ලේෂණයට භාජනය කරන ලද සිද්ධිමය පැමිණිලි සම්බන්ධයෙන් ගත් කල මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම හේතු කොට ගෙන වින්දිතයාට කුමන ආකාරයක විසඳුමක් හෝ සහනයක් එකදු පැමිණිල්ලකට හෝ ලැබී නොමැති බවද නිරීක්ෂණය වන තවත් එක් ප්‍රධාන කරුණකි.

අවසාන වශයෙන් මෙම සමස්ථ විශ්ලේෂණය තුළින් මානව හිමිකම් කොමිසම මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ප්‍රශ්න කිහිපයක් ඉස්මතු වේ. එනම්

1) පැමිණිල්ලක් කොමිසමේ ලියාපදිංචි වූ දින සිට ඊට අදාළ පාර්ශවයන් කැඳවා විමසීමක් පැවැත්වීමට යම් නිශ්චිත වූ කාල පරිච්ඡේදයක් පවතී ද?

2) එහිදී එක් විමසීමක් පැවැත්වූ පසු අදාළ පැමිණිල්ල තව දුරටත් නොවිසඳුනේ නම් ඊළඟ විමසීම් දිනය නියම කිරීම සම්බන්ධයෙන් කුමන ආකාරයක ක්‍රමවේදයක් කොමිසම අනුගමනය කරන්නේ ද?

3) වධහිංසනයන් වැනි විශේෂ කොට සැලකිය යුතු සිද්ධිමය පැමිණිලි සම්බන්ධයෙන් කඩිනමින් විමර්ශනය කර නිර්දේශ ලබා දීම සඳහා යම් විශේෂ යාන්ත්‍රණයක් හෝ ක්‍රමවේද කොමිසම සතුව පවතී ද?

4) එවැනි විශේෂ කොට සැලකිය යුතු සිද්ධිමය පැමිණිලි කොමිසමේ ක්ෂණික දුරකථන අංකයට වාර්ථා වීමේදී අදාළ වින්දිතයාට ක්ෂණික සහනයක් සැලසීමට කොමිසම කුමන ආකාරයේ ක්‍රමවේද භාවිත කරයි ද?

# 07. නිර්දේශ සහ සැලකිය යුතු පොදු කරුණු

ලංකාවේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, ජාතික පොලිස් කොමිසම ඇතුළු ස්වාධීන කොමිෂන් සභා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන අතර ඊට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වේ. ඉහත කී ස්වාධීන කොමිෂන් සභා පිළිබඳ සලකා බැලීමේදී විශේෂයෙන්ම රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ එම කොමිෂන් සභා මහජනයා වෙත විවෘතව නොපැවතුනි. එහිදී මෙම තත්වය යටතේ සිදුවන වධහිංසනයන් ඇතුළු මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් එම කොමිෂන් සභා වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට ක්‍රමවේදයන් සකස් කර තිබේද, ඒවා කොතෙක් දුරට ප්‍රායෝගික වේද, හදිසි ඇමතුම් අංක තිබේ නම් ඒවා නිසියාකාරව ක්‍රියාත්මක වේද, ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීම සම්බන්ධයෙන් වසංගත තත්වය යටතේ අනුගමනය කරන ක්‍රමවේදය කුමක්ද, යනාදී වශයෙන් ප්‍රශ්න ගණනාවක් පැන නැගුනි.

පොදුවේ ගත් කළ මානව හිමිකම් කොමිසම හා පොලිස් කොමිසම පැමිණිල්ලක් විමර්ශනය කිරීමේ දී ඊට අදාළ පාර්ශවයන් කැඳවූ පසු එහි ඊළඟ කැඳවීම් දිනය එදින දැනුම් දීමක් සිදු නොකරන අතර එය නැවත දැනුම් දීමේදී අනුගමනය කරන තේරීම් ක්‍රම වේදය, යාන්ත්‍රණය කුමක්ද යන්න ගැටළු සහගතය. බොහෝ අවස්ථා වලදී පළමු විමර්ශන දිනයට පාර්ශ්වකරුවන් කැඳවූ පසු එහිදී ප්‍රශ්නය නිරාකරණය නොවන අතර එහි ඊළඟ කැඳවීම් දිනය පාර්ශ්වකරුවන්ට දැනුම් දෙන්නේ මාස ගණනාවක් නැතහොත් වර්ෂ කිහිපයක් ගත වීමෙන් පසුවය. ඒ වන විට අදාළ වින්දිතයින්ගේ උද්යෝගිමත්භාවය පහව ගොස් ඔවුන් තම අයිතිවාසිකම් තහවුරු කර ගැනීමේ අරගලයෙන් ඉවත්ව සිටින අවස්ථා බොහෝ වේ. එසේම අනෙක් අතට මේ තුළින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන්ට වගකිව යුතු රාජ්‍ය නිලධාරීන් තව තවත් ශක්තිමත් වන අතර ඔවුන් තමන් අනුගමනය කරන නීතියට පටහැනි ක්‍රියාවන් දිගටම කරගෙන යාමට උඩගෙඩි සපයන්නකද් විය හැක. එබැවින් මෙම දුර්වලතා මගහරවා ගෙන විධිමත් වූ මානව හිමිකම් සුරක්ෂිත යාන්ත්‍රණයක් උදෙසා පහත නිර්දේශයන් යෝජනා කර සිටිමු.

- පැමිණිලි විභාගය කෙටි කලක් තුළ අවසන් කිරීම
- පැමිණිලිවලට අදාළ විමර්ශනයන් සඳහා ස්වාධීන විමර්ශන ඒකකයක් පිහිටුවීම
- පක්ෂග්‍රාහී හෝ තොරතුරු අනාවරණය කරනු ලබන කොමිසමේ නිලධාරීන්ට එරෙහිව නීතිය බලාත්මක කිරීම.
- පුද්ගලයින් රඳවා තබා ගන්නා ස්ථානයන්ට ක්ෂණික සංචාරයන් කිරීම හා එම ස්ථානයන් පිළිබඳ නිරීක්ෂණයන් වැඩි කිරීම.
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ හදිසි නීති රෙගුලාසි යටතේ සිදු කරනු ලබන අත්අඩංගුවට ගැනීම් පිළිබඳව කොමිසමේ මැදිහත් වීමට නීතිමය බලාත්මක භාවයක් ලබා දීම.
- නිර්දේශයන් ප්‍රදානය කිරීමෙන් පසුව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විමසා බැලීමට අංශයක් පිහිටුවීම.
- නිර්දේශයන්ට නෛතික බලාත්මක භාවයක් ලබා දීම.

**විසිපස් වසරක් !**

*ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය ගැන පසු විපරමක්*